# රුහුණ විශ්වවිද්‍යාලය - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
# ශාස්ත්‍රවේදී බාහිර උපාධි ප්‍රථම ශාස්ත්‍ර (පුනර්) පරීක්ෂණය - 2023 සඳහා
# අයදුම්පත් කැඳවීම

- රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් 2023 වර්ෂයේ පැවැත්වීමට නියමිත ඉහත සඳහන් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් විභාග අයදුම්පත් 2023.08.25 සිට 2023.09.24 දින දක්වා කැඳවනු ලැබේ.

- ලියාපදිංචි කාල සීමාව අවසන් වී ඇති, මෙතෙක් ලියාපදිංචිය දීර්ඝ කරවා නොගත් අපේක්ෂක අපේක්ෂිකාවන් විභාගය අයදුම් කරන අවස්ථාවේදී තම ලියාපදිංචි කාල සීමාව දීර්ඝ කර ගත යුතු අතර , ඒ සඳහා නියමිත අයදුම්පත් අන්තර්ජාලය මගින් ලබා ගත හැකිය. **ලියාපදිංචිය දීර්ඝ කර නොගන්නා අපේක්ෂක අපේක්ෂිකාවන් හට විභාග ප්‍රවේශ පත්‍ර බාගත කරගැනීමට අවකාශ නොලැබේ.**

- විභාගය සඳහා අයදුම් කිරීමේ දී පහත පරිදි ලියාපදිංචි හා විභාග ගාස්තු ගෙවිය යුතුය.

    - එක් වර්ෂයක් සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම රු. 2000.00
    - විභාග අයදුම්පත්‍ර ගාස්තු අසමත් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා රු. 1000 .00
    - ( සෞ.යු. වෛද්‍ය වාර්තා අනුමත වුවද පෙනී නොසිටි විභාග සඳහා ගෙවීම් සිදුකළ යුතුය.)

- නිවැරදිව සම්පූර්ණ කරන ලද විභාග අයදුම්පත්‍රය හා ගෙවීම් වවුචර්පත ( කාර්යාලයීය පිටපත) පහත ඇමුණුම් හරහා ලබාගෙන ගෙවීම් සිදුකොට " නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර" යන ලිපිනයට ලියාපදිංචි තැපැල හරහා දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය වෙත ලැබීමට සලස්වන මෙන් දැනුම්දෙනු ලැබේ.

- පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොමැති අපේක්ෂකයන් විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී එවනු ලබන සියලු අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලැබේ.

- පරීක්ෂණයට පෙනී සිටින විෂයන් , පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

- විභාග අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අයදුම්පත හා ගෙවීම් වවුචර්පත පහත ඇමුණුම් හරහා බාගත කර ගත හැක. ඔබ විසින් බාගත කරනු ලබන වවුචර් පතෙහි කොටස් 03 සම්පූර්ණ කර මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් රුහුණ විශ්වවිද්‍යාලයේ රැස් කිරීමේ ගිණුමට වවුචර්පතෙහි ඇති යොමු අංකය හරහා විභාග ගාස්තු ගෙවීම සිදු කොට එහි කාර්යාලයීය පිටපත අයදුම්පත සමග දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට ලැබීමට සලස්වන්න.